# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,918 — 1932ක්වූ අප්‍රේල් මස 15 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාඞ්ග නීති.

#### වර්ෂ 1898 ලෝකල්බෝඩ් ආඥාපණත.

වර්ෂ 1898 නොම්මර 13 දරණ ආඥාපණතේ 56වෙනි වගන්තියේ 21වෙනි කොටස යටතේ, හැටන් දික්ඔය ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලද එම ආඥාපණතේ 57වෙනි වගන්තිය යටතේ නියමිත ප්‍රකාර ලංකාවේ 1931සේ ස්ටේට් කවුන්සල් ඔඩර්ඉන් කවුන්සල් නම් ආඥාපණතේ 93වෙනි වගන්තිය පිට ආණ්ඩුකාර උත්තමයාණන්සේට ඇති බලයපිට පිළිගන්නාලද මෙහි පහත සඳහන් අතුරු ආඥාපණත් මහජනයාගේ දැන ගැනීම සඳහා ප්‍රසිද්ධකරනලදී.

චාස් බටුවන්තුඩාවේ,
පලාත් පරිපාලනය පිළිබඳ ඇමතිතුමා.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 11වෙනි දින කොළඹ
පලාත් පරිපාලන කන්තෝරුවේදීය.

#### වර්ෂ 1898වේ අංක 56 (21)වෙනි වගන්තිය යටතේ සාමාන්‍ය අතුරු පණත්.

(1) ගෙයක, පදිංචි ස්ථානයක, දේවස්ථානයක, වෙළඳාම් පලක, කොටසක් හෝ සියලුම කොටස් හොඳකාර එළිය සහ වාතය ඇතුල්වනාකාර තැබිය යුතුයි. සභාපතිතැන විසින් හෝ ඔහුගෙන් බලය ඇතුව ක්‍රියාකරන මූලාදැනියෙක් විසින් හෝ කොයිම විටකදී වුවත් එහි පිටින් හෝ ඇතුලෙන් සුදු හුනු ගෑමට හෝ වෙන අතුමකට පවිත්‍රකිරීමට නියමකලොත් වහාම එසේ කළයුතුයි.

(2) සෑම ගෙවල් අයිතිකාරයෝ විසින් ගෙවල් හෝ වෙනත් ගොඩනැගිලි ආදිය හොඳකාර තැබීමද බිත්තිවල සහ පොලවෙන් මීයන්ට වාසය නොකරන්ට හිල් ආදියක් නැතුව තැබීමද යුතුකමක්ව තිබේ. එසේ නැතුව අයිතිකාරයන් විසින් සභාපතිතැනට ඒත්තුගන හැටියට එය කුලියට ගෙන තිබෙන අය හෝ පදිංචිකාරයා ඉහතකී රාජකාරිය කිරීමට පොරොන්දුවී සිටින බව පෙන්නාසිටියොත් එකී කුලියට ගෙන තිබෙන අය හෝ පදිංචිකාරයා විසින් ඉහතකී රාජකාර්‍ය කළ යුතුයි.

(3) වෙළඳාම් පිණිස පාවිච්චිකරන සෑම ගොඩනැගිලිවල බිම සිමෙන්ති අල්ලා තිබිය යුතුයි. අනිකුදු ගොඩනැගිලි ගැන සභාපතිතැනගේ කැමැත්තක් කරනු ලැබේ.

(4) පදිංචි ගෙයක හෝ පදිංචි ගෙයක ස්තෝප්පුවක හෝ ගෙයක කොටසක්වූ හෙවත් ගෙයකට යාකර තිබෙන්නාවූ මඩුවක හෝ පැලක අශ්වයෝ, කොටළුවෝ, බූරුවෝ, හරක් සහ එළු, බැටළු ආදිය හෝ ඌරෝ නොතැබිය යුතුයි.

(5) වෙළඳාම පිණිස පාවිච්චිකරන ගොඩනැගිලිවල බඩු මුට්ටු සහ වෙළඳාම් බඩු ගොඩගසා තිබීම එළිය සහ හුළං ගැසීම නැති නොවන අන්දමට සහ පහසුවෙන් ගොඩනැගිල්ල සුද්දකරන්ට සුර්මත් අන්දමටත් තිබිය යුතුයි. ගොඩනැගිල්ලේ බිමෙන් හතරෙන් පංගුවක් හිස්ව තැබිය යුතුයි. වහලින් හෙවත් සිලිං එකින් අඩි හතරක් දුර ප්‍රමාණය ඉඩ හැර බඩු ගොඩගසා තැබිය යුතුයි.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ඉඩම ගරාවැටීම වැලැක්වීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

පිටපත නො. 2. නො. බී. ඇස්. පී. පී. 114. ගම—උඩබුලත්ගම අඹගමුවකෝරළේ කිරිවත්එළිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 347A | මීනුවන්දෙනියේහේන .. | හේන .. | ඇස්. හෙන්ද්‍රික් ප්‍රනාන්දු .. .. | 0 2 26·2 |
| 354A | හුණගෝවාවත්ත .. | එම .. | කේ. ජී. පුංචිමැනිකා, කේ. ඇච්. රතුඅප්පුහාමි, කේ. ඇම්. හෙන්ද්‍රික් අප්පුහාමි, කේ. ඇම්. අප්පුහාමි, කේ. ඇම්. සිත්අප්පුහාමි, කේ. ඇම්. බන්ඩා, කේ. ඇම්. රත්මැණිකා | 0 0 35·2 |

181——J. N. 18592—120 (4/32)
S 1

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ මැයි මස 13වෙනි දින අපරභාග 2කේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 9වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ලිඳක් බැන්දවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්හන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

බී. ඇස්. පී. පී. නො. 1,125. අතිරේක නො. 1. ගම—හිරණේගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 25A | ගෙදරගාවාඅක්කරය නොහොත් පුරන්වෙල | මුඩුඉඩම, ලිඳක්තිබේ .. | හිරණේගම පදිංචි ජයසුන්දර හේරත් මුදියන්සෙලාගේ කපුරාල | 0 0 0·75 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම් තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ මැයි මස 25වෙනි දින උදේ 8ට මඩාටුගම මුලාදෑනි බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 8වෙනි දින
අනුරාධපුරේ කච්චේරියේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
වැඩබලන ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## මැණ්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### මාතර දිස්ත්‍රික්කේ ආණ්ඩුවේ ඉඩම්වල මැණික් ගැරීමේ බලය ලබාගැණීමට ඉල්ලුම්පත්‍ර.

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් ඉඩමේ අවුරුද්දක් ඇතුළත මැණික් ගැරීමේ බලය ලබාගැණීම පිණිස සීල්කරණලද ඉල්ලුම්පත්‍ර මාතර උප ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1932ක්වූ මැයි මස 24වෙනි අඟහරුවාදා පෙරවරු 11 දක්වා මාතර කච්චේරියේදී භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත්‍ර කවරවල දමා සීල්කර එහි පිට වම් පැත්තේ "මැණික් ගැරීමේ බලය ලබාගැණීමට ඉල්ලුම්පත්‍ර" කියා ලියා එවිය යුතුයි. ඉහතකී දිනයේදී පෙරවරු 11ට ඉල්ලුම්පත්‍ර ගලවා බලනවිට ඉල්ලුම්කරුවන් හෝ ඔවුන් වෙනුවට පෙනීසිටින්ට නියි ආකාර පත්කරනුලැබූ වෙන අය වලුත් හෝ මාතර උප ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙනීසිටින්ට ඕනෑය.

3. කොළඹ ඉඩම් කොමසාරිස් උන්නාන්සේට යැවීම සඳහා උප ඒජන්ත උන්නාන්සේ විසින් තෝරාගනු ලබන ඉල්ලුම්පත්‍රය අයිතිකාරයා එහි සඳහන් සම්පූර්ණ මුදලද, මුලාදෑනියාගේ ගාස්තුව වන රුපියල් 10ද මුදලින් එදිනම වහාම ගෙවිය යුතුයි. ඉඩම් කොමසාරිස් උන්නාන්සේ විසින් එකී ඉල්ලුම්පත්‍රය භාරගනු ලද්දේනම් ගැරීම සම්බන්ධව නො. G. A.–A 133 දරණ පෝර්මයේ අවසරපත්‍රයක් ඉල්ලුම්පත්‍රය භාරගන්නාලද කොන්දේසි සියල්ලම හරියාකාර ඉෂ්ට කිරීමේ පොරොන්දුව පිට එකී ඉල්ලුම්කරු අත්සන්කරන්ට ඕනෑය.

4. අක්කරයකට රුපියල් 300කට අඩු ඉල්ලුම්පත්‍ර භාර ගනු නොලැබේ.

5. යම් ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර කිසිම ප්‍රශ්නයක් නැතුව පිළිගැණීමට හෝ ප්‍රතික්ෂේපකිරීමටද, ඉල්ලුම්පත්‍රයේ සඳහන් කාරණාවලින් යම් කොටසක් භාරගැනීමටද උප ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

6. තෝරාගනුලැබූ ඉල්ලුම්කරු විසින් ගැරුම් අවසරපත්‍රය ලබාගැනීම පිණිස ආණ්ඩුවේ බලයලත් මිනින්දෝරුකෙනෙක් ලවා ඉඩම මන්නවා එකී ඉඩමේ ප්ලෑනේ සහතිකකරනලද කොපි දෙකක් මාතර උපඒජන්ත උන්නාන්සේට පූර්වන් ඉක්මනින් එවිය යුතුවක් හැර ගැරුම්වලවල් වැසීම වෙනුවෙන් ඇප පිණිස රුපියල් 100ක් කච්චේරියේ තැන්පත්කර තබන්ට ඕනෑය. ගැරුම් අවසානයේදී උප ඒජන්ත උන්නාන්සේ සතුටුවන පරිදි වලවල් නියිආකාර වසාදැමූපසු ඉහතකී ඇප මුදල ආපසු දෙනුලැබේ.

7. අවසරපත්‍රය ලැබූ අය විසින් ගැරීම පටන්ගන්නාවූද අවසානකරන්නාවූ දිනයන් කොළඹ ආණ්ඩුවේ ලෝහ, ධාතු ශාස්ත්‍රඥතුමාට දැනුම්දිය යුතුයි. තවද ගැරුම් පතල් ආදිය ඕනෑමවිටක පරීක්ෂාකර බැලීමටද එතුමාට හෝ එතුමාගේ නිලධාරීන්ට ඉඩහැරිය යුතුයි.

8. මේ සම්බන්ධව වැඩිදුර කරුණු මාතර උප ඒජන්ත උන්නාන්සේගෙන් කච්චේරියේදී දැනගතහැක.

### ඉහත සඳහන් ඉඩම.

දකුණු පලාතේ මාතර දිස්ත්‍රික්කේ මොරවක්කෝරලේ බෙරලපනාතර ගමේ උතුරෙන් ප්ලෑන් නො. 320 දරණ ඇලට වෙන්කරනලද කට්ටිය සහ දකුණෙන් නො. 33 දරණ අවසාන ගම් සිතියමේ ආණ්ඩුව සන්තක ප්ලෑන් නො. 316 දරණ කට්ටියද යන කැබලිදෙක අතරේ පිහිටි දම්වැලක් පමණ පලලැති ඌරුබොක්ක ගඟේ පතුලේ දිගින් දම්වැල් තුනක ප්‍රමාණය.

එච්. ජේ. ඇල්. ලීකොලයර්,
උප ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1932ක්වූ අප්‍රේල් මස 8වෙනි දින
මාතර කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.